www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාක තන්ත්‍රය යුද නීතිය පැනවීමට සූදානම් වෙයි

**Iraq regime prepares for martial law**

**මයික් හෙඩ් විසිනි**
**2004 ජුලි 08**

බලයට පත් වී යන්තම් දින 10කට පසුව එක්සත් ජනපදය විසින් පත් කෙරුනු අන්තර්වාර අගමැති අයාද් අලාවිගේ ඉරාක තන්ත්‍රය වොෂින්ටනයෙන් ලැබුනු උපදෙස් මත රට පුරා හෝ එහි ඕනෑ ම කොටසක යුද නීතිය පැනවිය හැකි නීති සමුදායක් නියම කලේ ය. අලාවි ඊයේ අත්සන් තැබූ එම නීතීන් යටතේ ඇඳිරි නීති පැනවීම, නගර හා උපනගරවල මුර කපොලු පිහිටුවීම, ඉරාකයෙහි සෑම පුරවැසියෙකුට ම පාහේ බලපාන පරිදි ආයුධ සහිත පුද්ගලයන් රඳවා තබා ගැනීම ක්‍රියාත්මක කිරීමට ඔහුට හැකියාව ලැබේ.

බුෂ් පරිපාලනය ''විමුක්තියේ'' හා ''ප්‍රජාතන්ත්‍රවාදයේ'' නාමයෙන් වරක් සදාම් හුසේන් සතුව පැවති බලතලවලට සමාන බලතල ඇති කුරිරු පාලකයකු ස්ථාපනය කර ඇත යන කරුන හදිසි බලතල තෝරා ගැනීම මගින් අවධාරනය කෙරෙයි. කෙසේ වුවත් අලාවි පිලිබඳව සලකා බැලීමේ දී වොෂින්ටනය රට යටත් කර ගැනීමට එරෙහිව වර්ධනය වන විරුද්ධත්වය මැඩ ලීමට උත්සාහ දරන එහි ම ඍජු ආදේශකයකු ලෙස ඔහු ක්‍රියා කරනු ඇත.

යුද නීතිය ප්‍රකාශ කරනු ලැබූ විට සුවිශේෂ පලාත්වල ආන්ඩුකාරවරුන් ලෙස මිලිටරි නායකයන් පත් කිරීමේ හා ''ජාතික ආරක්ෂාවට වල කපන'' අපරාධ පිලිබඳව සැකයට ලක් වූ ඕනෑ ම අයකුගේ මෙන් ම කැරලිකරුවන්ට රැකවරනය, අරමුදල් හා සහාය සැපයීමේ චෝදනා ලත් අයගේ දේපොල තහනම් කිරීමේ අධිකාරය අලාවි සතු වනු ඇත. අනෙකුත් බලයන් අතරට සමස්ත උපනගර හා නගරවල මුර කපොලු පිහිටුවීම, සන්නිවේදනය සීමා කිරීම හා ප්‍රදේශ තුලට සහ ඉන් පිටතට සංචාරය සීමා කිරීම ඇතුලත් වේ. මිනී මැරීමේ සිට රාජ්‍ය දේපොල විනාශ කිරීම දක්වා විහිදෙන ප්‍රධාන අපරාධ පිලිබඳව චෝදනා ලත් ජනයා සඳහා විශේෂ අධිකරන නිර්මානය කිරීම කල හැකි වනු ඇත.

මෙම විශේෂ නීතිවලට ඉහලින් සහ එහායින් ජාතික ආරක්ෂාව සඳහා වන නීතියේ 6 වන වගන්තිය සත්‍ය වසයෙන් ම සීමා රහිත බලතල අලාවිට ලබා දෙයි: ''හදිසි තත්වය ප්‍රකාශ කරනු ලැබ ඇති ප්‍රදේශවල හදිසි තත්වය ප්‍රකාශිත එම කාල සීමාව තුල දී සන්නද්ධ හමුදා, හදිසි හමුදා, විශේෂ හමුදා, සිවිල් ආරක්ෂක හමුදා, අභ්‍යන්තර ආරක්ෂක හමුදා සහ ආරක්ෂක, රහස් තොරතුරු හා මිලිටරි රහස් තොරතුරු සේවාවන් අගමැතිවරයා වෙත කෙලින් ම වාර්තා කරනු ඇති අතර අගමැතිවරයා එවැනි හමුදාවල හා සේවාවල ප්‍රධානයන් සමග සම්බන්ධීකරනයෙන් ඔවුන්ගෙන් ඕනෑ ම අයකුට ස්වභාවයෙන් ම හිමි අධිකරන බලයන් ද හා හදිසි තත්වයන්ගේ අවශ්‍යතාවන්ට යෝග්‍ය කර්තව්‍යයන් ද පවරනු ඇත.''

තම බලතල ක්‍රියාත්මක කිරීමට අලාවිට සරලව ම අවශ්‍ය වන්නේ ඉරාක ජනාධිපති ගාසි අල්-යාවෙර්ගෙන් හා උපජනාධිපතිවරුන් දෙදෙනාගෙන් — මේ සියලු දෙනා ම එක්සත් ජනපදය පත් කල අය වෙති — සැදුම් ලත් ජනාධිපති කවුන්සිලයේ අනුමැතිය යි. දින 60ක් මෙම නියෝග පවතිනු ඇති අතර ක්ෂනිකව අලුත් කල හැකි වනු ඇත.

''ත්‍රස්තවාදීන්ට සහ නීති කඩන්නන්ට'' එරෙහිව සටන් කිරීමේ නාමයෙන් පිලිගන්වා ඇති හදිසි නීතියේ පලමු වන වගන්තිය විශේෂයෙන් යොමු වී ඇත්තේ ''ඉරාකය තුල පුලුල් පදනමක් සහිත ආන්ඩුවක් ස්ථාපනය කිරීමට'' ඇති විරුද්ධත්වය මුලිනුපුටා දැමීමට යි. වෙනත් වචනවලින් කියත හොත් එක්සත් ජනපදය හමුදා දිගට ම රැඳී සිටීමට හා එහි රූකඩ ආන්ඩුවට එරෙහි ඕනෑ ම විරුද්ධත්වයක් මර්දනය කිරීමට යුද නීතිය ප්‍රකාශයට පත් කල හැකි වනු ඇත.

කාලාන්තරයක් තිස්සේ නව නීති බලාපොරොත්තු වී ඇත. පසු ගිය සතියේ ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් බුෂ් කීවේ ඉරාකයේ සිටින 138,000ක් වන ඇමරිකානු හමුදාවන් යුද නීතිය ප්‍රකාශයට පත් කල හොත් එය ක්‍රියාත්මක කිරීමට අලාවිට උදව් කරනු ඇති බව යි. තෝරා ගත් සටන්කාමී කන්ඩායම්වලට සමාව දීම දිගු කිරීම පිලිබඳ යෝජනා සම්බන්ධව අලාවිගේ ඇමති මන්ඩලය තුල පැවති මතභේද නිසා නියම කිරීම දෙවරක් කල් දැමූ බව පෙනෙන්නට තිබේ.

සදාම් හුසේන් භාවිත කල මර්දනකාරී බලයන් සමග සංසන්දනය කිරීමට ඉඩ ඇති බව ගැන දැනුවත් ඉරාක තන්ත්‍රය සහ එහි උපදේශකයෝ හදිසි බලතල මානව හිමිකම් රැකවරනයන් මගින් සීමා වනු ඇතැයි කියා සිටියහ. මානව හිමිකම් ඇමති භක්තියාර් අමින් හදිසි නීතිය ප්‍රකාශයට පත් කර ඇති සියලු ප්‍රදේශ අධීක්ෂනය කිරීමට සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම විමර්ශනය කිරීමට විශේෂ කන්ඩායමක් යෙදීම පිලිබඳව අනතුරු ඇඟවී ය. නමුත් මානව හිමිකම් පිලිබඳ අමින්ගේ ආකල්පය ඔහු හදිසි නීතිය එක්සත් ජනපද දේශප්‍රේමී පනත සමග සන්සන්දනය කල විට

අනාවරනය විය. බුෂ් පරිපාලනය ඇමරිකානු පුරවැසියන් ද ඇතුලත් එක්සත් ජනපද පදිංචිකරුවන් දහස් ගනනක් චෝදනා හෝ නඩුවලින් තොරව කොටු කර ගෙන ඇත්තේ මෙම පනත යටතේ ය.

ජූනි 28 දා අලාවිට සහ ඔහුගේ තෝරා නො ගත් කැබිනට්ටුවට වොෂින්ටනය විසින් ස්වෛරී භාවය පවරනු ලැබීමට එක් හේතුවක් වූයේ ජනතා විරුද්ධත්වය මැඩීම එල්ල කර ගත් මිලිටරි මෙහෙයුම් වැඩි වීම මත ඉරාක මුහුනක් ඇමීමේ උවමනාව යි. මේ කර්තව්‍යය සඳහා අලාවි ප්‍රධාන පෙලේ හිටපු බාත්වාදී මිලිටරි, පොලිස් සහ රහස් තොරතුරු නිලධාරීන් බඳවා ගෙන ඇත.

බුෂ් පරිපාලනය පැත්තෙත් ගත් විට තම තනතුර සඳහා අලාවිගේ මූලික සුදුසුකම වූයේ පලමුව 1970 ගනන්වල දී සදාම් හුසේන්ට ද ඉන් පසු බ්‍රිතාන්‍ය හා ඇමරිකානු රහස් තොරතුරු සේවාවන්හි ඒජන්තයකු ලෙස ද ඉටු කරන ලද ඔහුගේ මැර සේවාවේ වාර්තාව යි. ඔහුගේ සංවිධානය වන ඉරාක ජාතික සම්මුතිය (Iraqi National Accord) සදාම්ගේ තන්ත්‍රය අස්ථාවර කිරීමට හා බලයෙන් පහ කිරීමට ගත් උත්සාහයක් තුල දී බැග්ඩෑඩයෙහි කාර් බෝම්බ පිපිරවීම් සංවිධානය කරමින් 1990 ගනන්වල සීඅයිඒය සමග වැඩ කලා ය.

ඉරාක ආක්‍රමනයේ ප්‍රමුඛ නව-කොන්සර්වැටිව්වාදී සහායකයකු වන ඩැනියෙල් පයිප්ස් ඕස්ට්‍රේලියානු රූපවාහිනියට දුන් සම්මුඛ සාකච්ඡාවක දී අලාවි පත් කිරීම පිටුපස පැවති දේශපාලනික ගනන් බැලීම් පිලිබඳ දර්ශකයක් සම්පාදනය කෙරුනි. එක්සත් ජනපදය පදනම් කර ගත් මැද පෙරදිග සංසදයේ අධ්‍යක්ෂවරයා සහ ත්‍රස්තවාදය සහ තාක්ෂනය පිලිබඳ පෙන්ටගන විශේෂ කාර්ය බලකායේ සාමාජිකයකු වන පයිප්ස් ජූනි 28 දා ඒබීසීහි *''ලේට්ලයින්''*වැඩ සටහනට කීවේ ''නව ප්‍රජාතන්ත්‍රවාදී ඉරාකයක් නිර්මානය කිරීම තුල'' බුෂ් පරිපාලනය ''ඉතා දුර'' ගොස් ඇති බව යි.

ඉරාකයෙහි කලින් අපේක්ෂා කල හැකි අනාගතය තුල දී ප්‍රජාතන්ත්‍රවාදය අත් කර ගත හැකි නො වේ යැයි පයිප්ස් කල්පනා කලේ ය. ''විය හැකි වනු ඇත්තේ කාලයත් සමග ප්‍රජාතන්ත්‍රවාදය දෙසට ගමන් කරන ශක්තිමත් හස්තයක් සහිත අයකු පාලනය ගෙන යන ඉරාකයකි. වාසනාවත් සමග ඒ සඳහා ප්‍රථම පියවර වනු ඇත්තේ මෙය යි, නමුත් මට ඒ පිලිබඳ විශ්වාසයක් නැත... මම කැඳවුම් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදීව සිතන ප්‍රබල නායකයකු, සංක්‍රමනය ඇති කිරීමට උදව් කරන අයකු ලෙස මම හඟින අයකුට යි.''

16 මසක ලේ වැගිරීමක් තිබිය දී වුව ඉරාක විරුද්ධත්වය මැඩීමට අසමත්ව ඇති වොෂින්ටනය සහ පෙන්ටගනය එවැනි දිශාවන්ගේ උපදේශවලට ඇහුම්කන් දී ඇති අතර යකඩ මුෂ්ටියක් සහිතව රට පාලනය කිරීමට 'ප්‍රබල පුද්ගලයකු' ස්ථාපනය කලේ ය.

### ෆලුජාහි බෝම්බ දැමීම්

යුද නීති නියාමයන් ප්‍රසිද්ධියට පත් කිරීමට පෙර වොෂින්ටනය අවශ්‍යැයි සලකන ඕනෑ ම පියවරක් ගැනීමට ඇති තම සූදානම පිලිබඳව උනුසුම් ප්‍රදර්ශනයක් අලාවි සිදු කලේ ය. ජනතා විරුද්ධත්වයේ මූලික මධ්‍යස්ථානයක් වන ෆලුජාහි දී කාන්තාවන් හා ලමුන් ද ඇතුලත්ව අවම වසයෙන් සිවිල් වැසියන් 12 දෙනකු මරා දැමූ එක්සත් ජනපද ගුවන් ප්‍රහාරයේ සෘජු වගකීම සඳහා ඔහු බාර ගත්තේ ය.

ඇමරිකානු මිලිටරි පාලනයෙන් පිටත තිබෙන, බැග්ඩෑඩයෙන් කිලෝමීටර් 30ක් බටහිරට වන්නට පිහිටි මේ නගරය මත එල්ල වූ ගුවන් ප්‍රහාර මාලාවකින් අවසන් ප්‍රහාරයේ දී පවුල් නිවස්නයකට එක්සත් ජනපද බෝම්බ ප්‍රහාර වැදුනි. සාක්ෂිකරුවකු කීවේ එක්සත් ජනපද මිලිටරිය බෝම්බ ටොන් 2ක් — රාත්තල් 500 බෝම්බ 4ක් හා රාත්තල් 1,000 බෝම්බ 2ක් — අත හැරීමෙන් පසු මුදාගැනුම්කරුවන්ට කල හැකි වූයේ අල්ප වූ දෙයක් බවත් නමුත් ශරීර කොටස් ඇහිඳ ගත් බවත් ය. ෆලුජා රෝහලේ වෛද්‍ය ඩියා ජුමායිලි සිරුරු 10ක් එහි ලඟා වී ඇති බවත් ඒවායින් බොහොමයක් කැලිවලට කැඩී ඇති බවත් කී ය.

එක්සත් ප්‍රකාශක රූපවාහිනී ප්‍රවෘත්ති සේවයේ වීඩියෝ පටයක් පෙන්නුම් කලේ පිපිරුම මගින් ගඩොල් කොටස් වීසි වී ගිය බවත් අසල තිබුනු බිත්තියක් මත ලේ ඉසුනු බවත් ය. නිවස තිබුනු තැන වූ අඩි 30ක් ගැඹුරු වල අසල එක්රුස් වූ මිනිස්සු තරුන ලමයකුගේ කමිසයක් ද ඇතුලු රෙදිපෙරෙදි කැබලි ගොඩ වෙතින් එලියට ඇද ගත්හ. ''ඔවුන් ත්‍රස්තවාදීන් ගැන කතා කරනවා, නමුත් මේවා නිකං පවුල් විතරයි,'' සිද්ධියෙන් කෝපයට පත් මිනිසෙක් කී ය. ''මෙය ඉරාක ආන්ඩුවට පිලිගත හැකි ද? මානව හිමිකම් කොහි ද?'' යි තවත් අයෙක් ඇසී ය.

ඇමරිකානු මිලිටරිය කීවේ තමන් මෙහෙයුම් ආයුධ 6ක් පාවිච්චි කිරීම සහාගයේ හා ඉරාක හමුදාවේ 'ත්‍රස්තවාදී ජාල විනාශ කිරීමේ' අධිෂ්ඨානය අවධාරනය කල බව යි. තම රජය ගුවන් ප්‍රහාරයට සහාය පල කලා පමනක් නො ව නිවස ඉලක්ක කර ගැනීම සඳහා තොරතුරු ද සැපයූ බව අලාවි ක්ෂනිකව ප්‍රකාශ කලේ ය. එක්සත් ජනපද ම්ලේච්ඡ ක්‍රියා සාධාරනීකරනය කිරීම සඳහා පහසු පලිහක් බවට පත්ව ඇති ජෝර්දාන ඉස්ලාමීය අන්තවාදියකු වන අබු මුසාබ් අල්-සර්කාවිගේ සහායකයන් එම නිවස්නය පාවිච්චි කර ඇති බව ඔහු කියා සිටියේ ය.

''ඉරාක ආන්ඩුවේ නිලධාරීන් හා ඉරාකයේ බහුජාතික හමුදාවන් අතර තොරතුරු විමසීමෙන් පසු ගිනිකොනදිග ෆලුජාහි සර්කාවිගේ දන්නා ලද ආරක්ෂක නිවසක් මත ප්‍රහාර එල්ල කිරීම සඳහා ඉරාක ආරක්ෂක හමුදා පැහැදිලි හා සිත් ගන්නා තොරතුරු සපයා දුන්හ'' යි අලාවි ප්‍රකාශයකින් කී ය. ''ඉරාක ජනතාව ත්‍රස්තවාදී කන්ඩායම් හෝ තම දුෂ්ට ක්‍රම

දිගට ම පවත්වා ගෙන යාමට වෙනත් ඕනෑ ම විදේශ සටන්කාමීන් සමග එක්ව කටයුතු කරන සර්කාවි ජාලය වැන්නන් නො ඉවසනු ඇත.''

සති දෙකක් එක්සත් ජනපද බෝම්බ ඇතුලත ෆලුජාහි නිවාස සමතලා කල පස් වන වතාව මෙය විය. ඒ සෑම වතාවක දී ම සර්කාවිගේ ඊනියා ආරක්ෂක නිවාස වෙත ප්‍රහාර නිරවද්‍යව මෙහෙය වූ බව කියැවින. පූර්ව ප්‍රහාරවල දී දුසිම් ගනන් ජනයා මිය ගොස් ඇත. සෑම අවස්ථාවක දී ම මරා දමනු ලැබූවන් සිවිල් වැසියන් බවට ප්‍රාදේශීය පදිංචිකරුවෝ සාක්ෂි දරති. ෆලුජා විරුද්ධත්වයේ නායකයන් මෙන් ම එක්සත් ජනපදය විසින් සන්නද්ධ කරන ලද හා මූල්‍ය පහසුකම් සපයන ලද ෆලුජා සේනාංක මිලීෂියාව නගරය තුල සර්කාවි හා ඔහුගේ සැක කටයුතු සංවිධාන සිටින බව කියන චෝදනා ප්‍රතික්ෂේප කර ඇත.

ෆලුජා නගරය අල්ලා ගැනීම සඳහා ඇමරිකානු හමුදාවන් 1,000කට අධික ජනතාවන් මරා දැමූ විට 300,000ක් ජනයාට නිවස්නය වී ඇති එම නගරය එක්සත් ජනපද අල්ලා ගන්නන්ට එරෙහි ජාතික විරුද්ධත්වයේ සංකේතයක් විය. අප්‍රේල් 5 දා සිට 9 දා දක්වා වූ දින හතර තිස්සේ එක්සත් ජනපද නාවික භටයන් එල්ල කල පූර්න පරිමාන ප්‍රහාරයක තර්ජනයට මුහුන දුන් ෆලුජාවේ ආරක්ෂකයන්ට අන්තිමේ දී පසු බැසීමට බල කෙරුනි.

බෝම්බ දැමූ නිවස ආසන්න ප්‍රදේශයේ සර්කාවිගේ සහායකයන් ක්‍රියාකාරී වුව ද නො වුව ද ප්‍රහාරය සහ අලාවිගේ ප්‍රකාශය සැලසුම් කෙරුනේ අල්ලා ගැනීමේ හමුදාවල සියලු විරුද්ධවාදීන්ට තර්ජනය කිරීමට හා ඔවුන් බිය වැද්දීමට යි. ප්‍රහාරය අලාවි යුද නීතිය යටතේ කුමක් පැමිනෙන්නේ දැයි පෙන්නුම් කරන නො සියුම් සංඥාවකි.

© www.wsws.org